# ඔබගේම වෙබ් අඩවියක් නොමිලේම අන්තර්ජාලයට යා කරන්න

**තමාටම කියා වෙබ් පිටුවක් හෝ වෙබ් අඩවියක් නිර්මාණය කරගන්නා අන්දම පසුගිය කලාපයක සවිස්තරව දැක්වූවා ඔබට මතක ඇතැයි සිතමි.**

එසේ තමන්ගේම වෙබ් අඩවියක් නිර්මාණය කරගැනීමට කැමති අය එම කලාපය නැවතත් පරිහරණය කළොත් වඩා හොඳ යැයි සිතමි.

වෙබ් අඩවියක් නිර්මාණය කරගත්තාට පමණක් ඔබ සෑහීමකට පත් නොවන බව දනිමි. ඔබගේ ඒකායන බලාපොරොත්තුව එම වෙබ් අඩවිය අන්තර්ජාලය හා සම්බන්ධ කිරීමයි.


ඔබගේ තොරතුරු හෝ ඕනෑම තොරතුරක් ලෝකයේ ඕනෑම කෙනෙකු හට බලාගත හැකි වන්නේ එසේ කළොත් පමණි.

මේ සඳහා ක්‍රම කීපයක් ඇත. මුදල් ගෙවා එම කටයුත්ත ඉෂ්ට කරවා ගැනීම බොහෝ දෙනාගේ පොදු අදහසයි.

ඔබ විසින්ම නිර්මාණය කරගත් හෝ වෙනත් අයෙකු ලවා නිර්මාණය කරගත් වෙබ් අඩවිය අඩංගු CD තැටිය දැන් ඔබ අතේ ඇතැයි සිතන්න. ඔබ මුලින්ම කළ යුත්තේ මෙම සේවාව (මෙම සේවාව 'web hosting' ලෙස හැඳින්වේ.) සපයන ආයතනයක් වෙත ගොස් මුදල් ගෙවා වෙබ් අඩවිය අන්තර්ජාලයට ඇතුළු කිරීමයි.

මේ සඳහා ඔවුන් මාසික කුලියක් ලෙස හෝ අවුරුද්දක කුලියක් ලෙස ඔබගෙන් නියමිත මුදලක් අයකරගනී.

අයෝම ජයසිංහ





1

නොමිලේ අන්තර්ජාලයට එක්කරගැනීමේ මාර්ගයක් විවෘතව පවතී. අන්තර්ජාලයේ එන සමහර සමාගම් කීපයක් නොමිලේ ඔබට ඒ අවස්ථාව සපයා දෙයි. නමුත් මෙම ක්‍රමයේ ඇති සුළු අවාසියක් වන්නේ, සීමිත ඉඩ ප්‍රමාණයක් පමණක් (bytes ප්‍රමාණයක්) ලබාදීමත්, ඩොමේන් නාමයක් නොලැබීමත්, දීර්ඝ වෙබ් නාමයක් ලැබීමත්ය.

මුදල් ගෙවා web hosting සිදු කරන විට ඔබට ලැබෙන විශේෂ වාසියක් වන්නේ, 'domain name' යැයි හැඳින්වෙන වෙබ් නාමයක් ඔබට ලැබීමයි. උදහරණයක් ලෙස ඔබගේ නම 'නිමල්' යැයි සිතුවොත් සමහරවිට ඔබට ලැබෙන වෙබ් ලිපිනය "www. nimal.com" වැන්නක් විය හැකිය. එය ඉතා කෙටි පහසු හා කාටත් මතක තබාගත හැකි නමකි.

එසේම නොමිලේ අන්තර්ජාලයට එක්කරගැනීමේ මාර්ගයක් විවෘතව පවතී. අන්තර්ජාලයේ එන සමහර සමාගම් කීපයක් නොමිලේ ඔබට ඒ අවස්ථාව සපයා දෙයි.




2

නමුත් මෙම ක්‍රමයේ ඇති සුළු අවාසියක් වන්නේ, සීමිත ඉඩ ප්‍රමාණයක් පමණක් (bytes ප්‍රමාණයක්) ලබාදීමත්, ඩොමේන් නාමයක් නොලැබීමත්, දීර්ඝ වෙබ් නාමයක් ලැබීමත්ය. උද :www. geocities.com / nimal වැන්නක් ය.

එහෙත් ලංකාවේ බොහෝ දෙනා, මෙම නොමිලේ සපයන සේවාව විශාල වශයෙන් ප්‍රයෝජනයට ගනී.

නොමිලේ වෙබ් සේවාව සපයන ආයතන අතරින් වඩාත් ජනප්‍රිය වෙබ් අඩවියක් වන්නේ www. geocities.com ය.

එම නිසා මෙම ලිපියෙන් geocities මගින් වෙබ් අඩවියක්, අන්තර්ජාලයට යා කරන අන්දම සොයා බලමු.

හැමටම පළමුව ඔබ එක දෙයක් කළ යුතුය. ඩිස්කටයේ හෝCD තැටිය තුළ ඇති ඔබගේ වෙබ් අඩවියේ ලිපි ගොනු සියල්ල ඔබ භාවිතා කරන පරිගණකයේ හාඩ් ඩිස්ක් එකට ගබඩා කළ යුතුය. එම ෆයිල් ඇති ස්ථානය හොඳට මතක තබාගන්න.

දැන් ඔබගේ පරිගණකයේ internet විවෘත කරන්න. එහි යොමුවට www. geocities. com යන්නType කර Enter බොත්තම Press කරන්න. එවිට 1 රූපයේ දැක්වෙන එම අඩවියේ මුල් පිටුව විවෘත වේ.

දැනටමත් ලියාපදිංචි වී ඇති සාමාජිකයන් සඳහා පමණි, මෙහි Yahoo ID සහ password යන හිස්තැන් පිරවීමට ඇත්තේ.

නමුත් ඔබ නවතම සාමාජිකයෙක් නිසා ඔබ මෙහි අලුතෙන්ම ලියාපදිංචි විය යුතුය.


මේ සඳහා 1 රූපයේ "sign in" බොත්තම Press කළයුතුය. එවිට 2 රූපයේ ඇති පිටුව විවෘත වේ. එහි "sign up now" වදන click කරන්න. එවිට, ඔබ විසින් පිරවීමට ඇති දීර්ඝ ෆෝර්මයක් දිගහැරේ. (3 රූපය) එහි අසා ඇති ප්‍රශ්නවලටත්, වෙනත් තොරතුරුත්, නිවැරදිව පිරවිය යුතුය. මේ ක්‍රියාමාර්ගය අවසාන වනතුරු නිවැරදිව කළොත්, ඔබට ඔවුන් විසින් වෙබ් නාමයක් පිරිනමනු ලැබේ. ඉන්පසු ඔබේ නිල වෙබ් නාමය වනුයේ මෙයයි. වෙබ් නාමය නිර්මාණ වූ පසු එය ඔබට ප්‍රදර්ශනය වේ. එම නාමය click කළ විට ඔබටම ඔබගේ වෙබ් අඩවියට පිවිසිය හැකිය. එනමුත් එය තවමත් හිස් වෙබ් අඩවියකි.


හිස්වූ එය වෙබ් පිටුවලින් සැරසීමට ක්‍රම 2 ක් ඇත. ඔවුන් විසින්ම ඉදිරිපත් කරන වෛවර්ණ "රෙඩි මේඩ්" වෙබ් පිටු ලබාගෙන ඒවා ඔබගේ නවතම පිටුවට ඇතුළත් කරගැනීම එක් ක්‍රමයකි. ඒ සඳහා සියළු පහසුකම් ඔවුන්ගේ වෙබ් අඩවියේ ඇත.


අනෙක් ක්‍රමය වන්නේ, ඔබගේම වෙබ් පිටුවක් (හාඩ් ඩිස්කයේ තැන්පත් කළ) මෙයට ඇතුළු කිරීමයි. ඒ සඳහා ඔබගේ හිස් වෙබ් අඩවිය නිර්මාණය වූ බව දැක්වෙන ඔවුන්ගේ වෙබ් පිටුව බලන්න. (4 රූපය) එහි "File manager" වදන බලන්න. එය click කළ විට 5 රූපයේ දැක්වෙන පිටුව දිගහැරේ. එහි "Open file manager" වදන click කළවිට වඩාත් වැදගත් පිටුව දිගහැරේ. (6 රූපය)


සියළුම වෙබ් පිටු කළමනාකරණය කරන්නේ මෙතැනය. මේ පිටුවේ දකුණු පස උඩ හරියේ "Upload Files" වදන ඇති බොත්තමක් දිස්වේ. මෙහි තේරුම "ලිපිගොනු ගබඩා කිරීමයි" එයclick කළවිට 7 රූපයේ දැක්වෙන, පිටුව විවෘත වේ. මෙම පිටුව ඔබගේ හාඩ් ඩිස්කයට සම්බන්ධවීමේ ප්‍රධාන පිටුවයි. එහි "Browse" වදන සහිත හිස් කොටු 4 ක් හෝ 5 ක් දිස්වේ. දැන් කළයුත්තේ මෙහි Browse වදන click කිරීමයි.


එවිට ඔබගේ පරිගණකයේ "ෆයිල් බ්‍රවුසරයක්" දැක්වෙන අවස්ථාවකට පැමිණේ. ඉතිරි කාර්යය ඉතා පහසුය. දැන් කළ යුත්තේ, හාඩ් ඩිස්කයේ ඔබ තැන්පත් කළ ඔබේම වෙබ් පිටුවේ ලිපිගොනු මෙම බ්‍රවුසරයෙන් සොයා යැමයි.







උදාහරණයක් ලෙස නියමිත ලිපිගොනුව හෝ ෆයිල් එක සොයාගත් විට එය click කර දෙවනුව "open" බොත්තම press කරන්න. එවිට "තෝරාගත් නියමිත ෆයිල් එක" 7 රූපයේ හිස්තැන් කොටුවකට පැමිණේ. මේ ආකාරයට වරකට එක බැගින් සෑම ෆයිල් එකක්ම upload කළ යුතුය. නැවත ඔබ 6 රූපයේ දැක්වෙන පිටුවට යායුතුය. දැන් 5 රූපයේ දැක්වූ පිටුව තරමක් වෙනස් වී ඇති බව ඔබට පෙනේ. ඔබගේම ෆයිල් පිළිවෙළකට මෙහි අසුරා ඇති බව පෙනේ.

දැන් මෙම පිටුවේ වම් පස උඩම ඇති "your site" යන්නෙහි ඇති ඔබගේ geocities වෙබ් අඩවිය click කරන්න.

ඔබගේම වෙබ් අඩවිය අන්තර්ජාලයේ පිහිටුවා ඇති අයුරු අපූරුයි නේද? ඔබගේ නෑ මිතුරන් විශේෂයෙන්ම දුර රටවල වෙසෙන අයට ඔබගේ මෙම ලිපිනය e mail මගින් හෝ ලිපි මගින් දන්වා යවන්න. මෙහි ඇති විශේෂ වාසිය වන්නේ, ඕනෑම පසු අවස්ථාවක මෙය සංස්කරණය කිරීමේ හැකියාවයි.

මේ සඳහා 'ෆයිල් මැනේජර්' තුළ ලිපිගොනු මකාදැමීම, අලුතින් එකතු කිරීම යනාදිය කළ හැකිය. ඔබගේ Yahoo ID සහ රහස් අංකය ඔබ පමණක් දන්නා නිසා වෙනත් කිසිවෙකුට ඔබගේ ෆයිල් මැනේජර් වෙත ගොස් අඩවිය වෙනස් කිරීමේ හැකියාවක් නොමැති බවද සලකන්න. ❑

## නිවැරදි කිරීමයි.

පසුගිය කලාපයේ පළවූ ඔබේ පරිගණක තිරයට අලංකාර දින දර්ශණයක් යනුවෙන් පළවූ ලිපියෙහි සඳහන් වෙබ් ලිපිනය W W W . Web Shots . Com යනුවෙන් නිවැරදි විය යුතුවේ. එමෙන්ම මෙහි නවතම සංස්කරණයෙහි මුහුණත මෙන්ම සැකසුම් ද සුළු වෙනසකම් වලින් යුක්ත වේ.